# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>

***(2019 ජනවාරි මස 01 දින සිට 2019 මාර්තු මස 31 දක්වා)***

මුදල් කොමිෂන් සභාව විසින් 2019 ජනවාරි මස 01 වන දින සිට මාර්තු මස 31 දින දක්වා ඉටු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර මෙම වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

### 01. ඉදිරි වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාවයන් පිළිබඳ අයවැය මාර්ගෝපදේශ පළාත් සභා වෙත නිකුත් කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වල ප්‍රාග්ධන හා පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා තක්සේරුව සම්බන්ධයෙන් පළාත් සභා බලධාරීන් වෙත වාර්ෂිකව මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. 2020 වර්ෂයේ අවශ්‍යතා තක්සේරුව සඳහා සකස් කරන ලද විස්තරාත්මක මාර්ගෝපදේශ හා අවශ්‍ය ඇමුණුම් සියලුම පළාත් සභා ලේකම්වරුන් වෙත යවා ඇත.

මුදල් කොමිෂන් සභාවට පළාත් අරමුදල් අවශ්‍යතා තක්සේරුව ඉදිරිපත් කිරීම ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා අදාල මාර්ගෝපදේශයට විධිමත් ආකෘති පත්‍ර ඇතුළත් කර ඇත.

2020 මූල්‍ය වර්ෂය සඳහා සම්පූර්ණ කරන ලද පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරුව පිළිවෙළින් 2019 අප්‍රේල් මස 30 වන දිනට පෙර හා 2019 මැයි මස 31 වන දිනට පෙර මුදල් කොමිෂන් සභාව වෙත ලබා ගත හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

### 02. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය - 2019

2019 මාර්තු මස පළාත් සභා කිහිපයක වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු අතර මුදල් කොමිෂන් සභාව විසින් මෙම සැලසුම් ඉතා හොඳින් අධ්‍යයනය කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින්, ලේකම් සහ අදාල නිළධාරීන් ඇතුළුව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ඇතුලු කණ්ඩායමක්, 2019 මාර්තු මස 19 වන දින ඌව පළාත් සභාවේත් 2019 මාර්තු මස 27 වන දින දකුණු පළාත් සභාවේත් 2019 වාර්ෂික සංවර්ධන සැලසුම් සහා දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් සමාලෝචනය කරන ලදි.

මෙම සමාලෝචන රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම්වරුන්, පළාත් සභා ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් සභා වල ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සහභාගි වූහ. මෙම පළාත් සභා දෙකෙහිම 2019 වර්ෂය සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කරන ලද අතර සමාලෝචන රැස්වීම්වලදී එකඟ වූ පරිදි ඇතැම් සංශෝධන වලට යටත්ව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව එකඟතාවය ලබාදී ඇත.

අනෙකුත් පළාත් සභාවන්හි සමාලෝචන රැස්වීම් එම පළාත් සභා වල වාර්ෂික සැලසුම් ලැබුණු පසු අප්‍රේල් මාසයේ පැවැත්වීමට නියමිතව ඇත.

### 03. 2019 වර්ෂය සඳහා නිර්දේශ

2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම සඳහා අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳ නිර්දේශ 2019 පෙබරවාරි මස 21 වන දින සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 (ජ) වගන්තියට අනුකූලව)

## 04. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2017

මුදල් කොමිෂන් සභාවේ 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන්ම සකස් කර 2019 ජනවාරි මස 29 වන දින මුදල් කොමිෂන් සභාවේ සභාපති යූ. එච්. පලිහක්කාර මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී.

මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් වන ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා, මහාචාර්ය එම්. එම්. සෆ්රුල්ලා මහතා, වී. කනගසභාපති මහතා හා මුදල් කොමිෂන් සභාවේ ලේකම් ඒ. ටී. එම්. යූ. ඩී. බී. තෙන්නකෝන් මහතා ද ඒම අවස්ථාව සඳහා සහභාගී වූහ. 2019 මාර්තු මාසයේ දී මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.




## 05. පළාත් විගණන වාර්තා පිළිබඳ මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණයන් සකස් කිරීම

දකුණ, සබරගමුව සහ ඌව පළාත් සභාවන් සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විගණන වාර්තා පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද නිරීක්ෂණයන් හා සමාලෝචනයන් කොමිෂන් සභාව විසින් සලකා බැලූ අතර අදාල නිරීක්ෂණයන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කරන ලදී. පළාත් සභාවල පරිපාලනය වැඩිදියුණු කිරීම හා පළාත් සභා මට්ටමේ විගණන විමසුම් අවම කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණයන් ප්‍රයෝජනවත් වනු ඇත.

## 06. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම

රාජගිරිය, සරණ මාවතේ, අංක 03 ස්ථානයේ පිහිටා ඇති මුදල් කොමිෂන් සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ල අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරව විවෘත කරන ලදී. මෙම අවස්ථාව සඳහා ගරු කථානායක කරු ජයසූරිය මහතා, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා, ගරු පළාත් සභා ආණ්ඩුකාරවරුන්, ගරු පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්, ආරාධිත අමුත්තන් සහ නිලධාරින් සහභාගි වූහ.





## 07. මුදල් කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 බී සහ 154 ජ (1) (ඇ) වගන්තිය යටතේ මුදල් කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් පහත සඳහන් සාමාජිකයින් නැවත පත් කරන ලදී.

- සභාපති : උදිත හරිලාල් පලිහක්කාර මහතා
- සාමාජික : වී. කනගසභාපති මහතා
- සාමාජික : මහාචාර්ය එච්. එම්. සෆ්රුල්ලා මහතා

මීට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (1) (අ) සහා (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති සහ භාණ්ඩාගාර ලේකම්වරයා ද නිළ බලයෙන් මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස කටයුතු කරනු ඇත.

## 08. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය

පුනරාවර්තන වියදම් සඳහා වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියෙහි පළමු පියවර දැනටමත් අවසන් කර ඇති අතර, පළමු මූලාදර්ශය එහි සංවර්ධන කටයුතු සිදු කරන "තීක්ෂණ" සමාගම විසින් නිර්මාණය කර මුදල් කොමිෂන් සභාවේ අදහස් සහ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇත. මුදල් කොමිෂන් සභාවේ සහයෝගය ඇතිව තොරතුරු පද්ධතියේ දෙවන අදියර සකස් කරමින් සිටී. අප්‍රේල් මස ආරම්භයේ දී නිමැවුම පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සංවර්ධකයා අපේක්ෂාවෙන් සිටින අතර අප්‍රේල් මස 25 වන දිනට පෙර අවසාන නිමැවුම මුදල් කොමිෂන් සභාව අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## 09. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව

2018 මාර්තු මස 28 වන දින අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවේ පළමු කාර්තුමය රැස්වීම පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ප්‍රධානාත්වයෙන් පවත්වන ලද මෙම විගණන කමිටු රැස්වීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාද සහභාගී විය. රැස්වීමේදී ගන්නා ලද තීරණයන් අවශ්‍ය පසු විපරම් කටයුතු සඳහා මුදල් කොමිෂන් සභාවේ සියලු කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව කොමිෂන් සභාව විසින්, දෛනික අභ්‍යන්තර විගණන කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්යසාධනය උදෙසා ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් බව පෙන්වාදෙන ලදී.

## 10. වැඩ අධ්‍යයනය

මුදල් කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයකට අනුව, මුදල් කොමිෂන් සභාව තුළ යෝග්‍ය කාල සටහනක් සහ මානව සම්පත් ඵලදායී ලෙස යොදා ගනිමින් වඩා ඵලදායී හා කාර්යක්ෂමව කාර්යභාරය ඉටු කිරීම සඳහා සංවිධානයේ නිමැවුම වැඩිදියුණු කිරීමේ අරමුණින් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා වැඩ අධ්‍යනයක් පැවැත්වීමට තීරණය කර ඇත.

## 11. මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ 2018 වර්ෂයේ හතරවෙනි කාර්තුව සඳහා වූ කාර්ය සාධන වාර්තාව 2019 පෙබරවාරි මස 06 වන දින ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 12. කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය

### 12.1. ආරාධිත දේශණ

පහත සඳහන් ආරාධිත දේශකයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

| නම | මාතෘකාව | දිනය |
|---|---|---|
| මහාචාර්ය නලින් අබේසේකර මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විවෘත විශ්ව විද්‍යාලය | වඩා යහපත් 2019 වර්ෂයක් සඳහා | 2019 ජනවාරි මස 01 වන දින |
| ආචාර්ය පී. විශාකා හිදෙල්ලගේ මහත්මිය | ශ්‍රී ලංකාවේ ආපදා | 2019 ජනවාරි මස 10 වන දින |

### 12.2. දේශීය පුහුණු

මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් හට පුහුණුවීම් අවස්ථා ලබාදී ඇති අතර එම නිලධාරීන්ගෙන් කිහිප දෙනෙකු පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූහ.

- මූලික ඉංග්‍රීසි භාෂාව
- මූලික දෙමළ භාෂාව
- මූලික සිංහල භාෂාව

## 13. පළාත් ක්‍රීඩා අංශ සංවර්ධනය පිළිබඳ රැස්වීම

2019 ජනවාරි මස 17 වැනි දින සියලුම පළාත් වලට අයත් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුන් හි අධ්‍යක්ෂකවරුන් සමඟ රැස්වීමක් මුදල් කොමිෂන් සභාවෙහි පවත්වන ලදී. මෙම රැස්වීම සඳහා ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද සහභාගි විය.

මෙම රැස්වීමේ අරමුණ වූයේ, අදාල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය පසුබිමක් සඳහා සියලුම පළාත් ක්‍රීඩා අංශය සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටළු සහ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීමයි.

## 14. සමුපකාර, පරිවාස හා ළමාරක්ෂක, සමාජ සේවා සහ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ රැස්වීම්

2019 මාර්තු මස 01 වන දින සියලුම පළාත්වල සමුපකාර, පරිවාස හා ළමාරක්ෂක සහ සමාජ සේවා කොමසාරිස්වරුන් සමග රැස්වීමක් මුදල් කොමිෂන් සභාවෙහි පවත්වන ලදී. මෙම රැස්වීමේ ප්‍රධාන අරමුණ වූයේ පෙර වසර වල ප්‍රගතිය සමාලෝචනය කිරීම, අදාල ගැටළු / අභියෝග සාකච්ඡා කිරීම සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

## 15. සමාජ ආර්ථික දර්ශක හා තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීම පිළිබඳ සාකච්ඡාව

මුදල් කොමිෂන් සභාව විසින් 2019 මාර්තු මස 8 වන දින ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, මහ බැංකුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික සැළසුම් දෙපාර්තමේන්තුව අතර සාකච්ඡාවක් සංවිධානය කරන ලදි. මෙම රැස්වීමේ අරමුණ වූයේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැන බැලීම සඳහා සමාජ ආර්ථික දර්ශක සැකසීමේ ක්‍රියාපටිපාටිය (TOR) සාකච්ඡා කිරීම හා එය අවසන් කිරීමයි. එම ක්‍රියාපටිපාටිය නැවත සකස් කිරීම හා තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා අදාල නිලධාරින් අතර බෙදා හැරීමට තීරණය කර ඇත.

## 16. ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමඟ ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනයන් පිළිබඳ සාකච්ඡාව

2019 මාර්තු මස 25 වන දින මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ සහභාගීත්වයෙන් මුදල් කොමිෂන් සභාවෙහි පැවැත්විය. සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වූයේ පළාත් පාලනය හා පළාත් සභා ක්‍රමය තුළ බලය බෙදා හැරීම සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනයන් සිදුකිරීමයි.

මෙම බලය බෙදාහැරීම කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාකර වීමට සහ වඩා යහපත් භාවිතයන් සඳහා ඒකාබද්ධ අධ්‍යයනයන් උපකාරීවේ යැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කර ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කර ඇත.

## 17. පළාත් සභා පාලනය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව

පළාත් සභාවල පාලන කටයුතු වැඩිදියුණු කිරීම මැයෙන්, මුදල් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද එක්දින වැඩමුළුවක් 2019 මාර්තු මස 30 වන දින මුදල් කොමිෂන් සභාවෙහි පවත්වන ලදී. සියලු පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු, පරිපාලන හා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම) සහ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරීන් මෙම වැඩමුළුව සඳහා සහභාගි වූහ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, භාණ්ඩාගාර ලේකම්, මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ මුදල් කොමිෂන් සභාවේ හිටපු සභාපති අශෝක එස්. ගුණවර්ධන මහතා යන අයද මෙම දේශන හා සාකච්ඡාවලට සහභාගි විය.

## 18. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

2019 මාර්තු මස 25 වන දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් පනත් කෙටුම්පත පිළිබඳ යම් යම් නිරීක්ෂණයන් මුදල් කොමිෂන් සභාව වෙත ලිපියකින් දැනුම් දී ඇත. මෙම නිරීක්ෂණයන් මුදල් කොමිෂන් සභාව විසින් සලකා බැලූ අතර එම කාරණා සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග වැඩිදුරටත් සාකච්ඡා කිරීමට තීරණය කර ඇත.

## 19. විශේෂ අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වලට සහාය දැක්වීම සඳහා විශේෂ අධ්‍යයනයන් ගණනාවක් සිදු කර ඇත,

එනම්,

- මධ්‍යම රජයේ ආදායම් පළාත් සභාවලට මාරු කිරීම
- පළාත් සභා විසින් එකතු කරනු ලබන වක්‍ර ආදායම් (ජාතිය ගොඩනැගීමේ බදු)
- මුදල් කොමිෂන් සභාවේ පරිපාලන අංශය විසින් සකස් කරන ලද මුදල් කොමිෂන් සභාවේ මානව සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පත
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනය - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ මුදල් කොමිෂන් සභාවේ හි භාවිතය
- පළාත් සැලසුම් ක්‍රියාවලිය - නැගෙනහිර පළාත් සභාවේ භාවිතය

## 20. සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී වීම

මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ කාර්ය මණ්ඩලය පහත සඳහන් රැස්වීම් / වැඩමුළු සඳහා සහභාගි වූහ.

- ශ්‍රී ලංකාවේ නගරයන් හි තත්වය
- ජාතික ප්‍රතිපත්ති ඇගයීම් රාමුව සකස් කිරීම

- අවුරුදු පහක සංවර්ධන සැලැස්ම - වයඹ පළාත
- ව්‍යපෘති මෙහෙයුම් අත්පොත සමාලෝචනය කිරීම
- හාරිස්පත්තුව සනීපාරක්ෂක සේවය සඳහා ශ්‍රමිකයන් බඳවා ගැනීම
- සේවක සංඛ්‍යාව ප්‍රතිව්‍යුහගත කිරීම - දකුණු පළාත
- සේවක සංඛ්‍යාව සමාලෝචනය - පරිවාස හා ළමාරක්ෂක සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනය
- පළාත් පාලන සහාය ව්‍යාපෘති
- සංකේත ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ හැකියාවන් පිළිබඳ හා පළාත් ප්‍රඥප්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ස්ථාන ගත කිරීම පිළිබඳ අධීක්ෂණ කමිටුව
- ජාත්‍යන්තර / ප්‍රාදේශීය සම්මන්ත්‍රණ සහ රැස්වීම් පැවැත්වීම
- ශක්තිමත් රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය හරහා විශ්ව සෞඛ්‍ය ආරක්ෂණය ගොඩනැගීම
- නිෂ්පාදිත කිරි හා දියර කිරි පිළිබඳ සම්මන්ත්‍රණය
- 2019 රාජ්‍ය අයවැය තුළින් ආර්ථිකයට ඇති බලපෑම් පිළිබඳ සම්මන්ත්‍රණය
- ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය පිළිබඳ සම්මන්ත්‍රණය
- මහාචාර්ය අමර්ත්‍ය සෙන්; (ඉන්දියානු ආර්ථික විද්‍යාඥයකු / දර්ශනවාදියෙකු)
- 21 වන සියවසයේ ඉන්දියාවේ ආර්ථික දැක්ම
- ජල රාජ්‍යතාන්ත්‍රිකත්වය ; ජලය ජාත්‍යන්තර සබඳතා මෙවලමක් ලෙස
- කෘතිම බුද්ධිය පිළිබඳ භූ දේශපාලනය
- 2019 අයවැය විශ්ලේෂණය
- කෘතිම බුද්ධිය භාවිතා කිරීමේ ජාතික උපාය මාර්ග

## 21. මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය කාර්යය සාධනය

මුදල් කොමිෂන් සභාව විසින් මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය මාසිකව සමාලෝචනය කරනු ලබයි. 2019 වසරේ පළමු කාර්තුවේ කාර්ය සාධනය සමාලෝචනය සිදු කරන ලදී.

## 22. මුදල් කොමිෂන් සභාවේ අනුකූලතා වාර්තාව

මුදල් කොමිෂන් සභාව එහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සියලු අනුකූලතාවන් සපුරා ඇති බවට සහතික කරයි. මේ සම්බන්ධයෙන් අනුකූලතා වාර්තා මාසිකව කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

## 23. මුදල් කොමිෂන් සභාවට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

අධ්‍යක්ෂකවරයකු (ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන) හා රාජ්‍ය කළමනාකරණ සහකාරවරියක මුදල් කොමිෂන් සභා ලේකම් කාර්යාලයට පත් කරන ලදී.

## 24. කොමිෂන් රැස්වීම්

- ✓ පහත සඳහන් දිනයන් හි කොමිෂන් රැස්වීම් 03 ක් පවත්වන ලදී,
  - 26.01.2019
  - 09.02.2019
  - 30.03.2019
- ✓ කොමිෂන් සභා අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර රැස්විය.
- ✓ සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පැවැත්වූ අතර තීරණ හා මග පෙන්වීම් අනුගමනය කර ඇත.